# කාර්යාංශයේ ලියාපදිංචියෙන් තොරව රට රැකියා සඳහා පිට කරන ජාවාරමක් නීතියේ රැහැනට...........

## ගමන් බලපත්‍ර 459 ක් ඒ අතර.....




විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචියකින් තොරව, කූට ලෙස විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් පිටකරන ජාවාරමක් හෙළි කරගැනීමට කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශයට හැකි වී තිබේ. විමර්ශන නිළධාරීන් අද දින (2015.02.20) කළ වැටලීමේදී මෙම ජාවාරමට සම්බන්ධ වූවන් හඳුනාගෙන ඇත. මරදාන මාලිගාකන්ද පාරේ පිහිටි, කාර්යාංශයේ ලියාපදිංචි රැකියා ඒජන්සියක සහයෙන් මෙම ජාවාරම කරගෙන ගොස් තිබෙන අතර ජාවාරම්කරු එම ස්ථානයේදීම අත් අඩංගුවට ගෙන තිබේ. මීට පෙර කාන්තාවන් දෙදෙනෙකු කාර්යාංශයේ ලියාපදිංචි නොකර

විදේශ රැකියා සඳහා යැවීමට මෙම ජාවාරමට සම්බන්ධ වූවන් විසින් කටයුතු කර ඇති බව විමර්ශන වලදී හෙලි වී ඇත.

වැටලීම සිදු කරන අවස්ථාවේදී අදාල ස්ථානයේ තිබී අන් සතු ගමන් බලපත්‍ර 495 ක් කාර්යාංශයේ විමර්ශන නිළධාරීන් භාරයට ගෙන තිබේ. මෙම ජාවාරමට සම්බන්ධ විදේශ රැකියා ආයතනය 2008 වර්ෂයේදී අධිකරණ තීන්දුවක් මත බලපත්‍රය අහෝසි කොට තිබේ. අත් අඩංගුවට ගත් විදේශ ගමන් බලපත්‍ර අතර, 1989 දී සැකසූ ඒවාද තිබී ඇත. මෙම ස්ථානයේ සිට මෙලෙස විදේශ රැකියා ජාවාරමක් සිදු කරන බවට, අමාත්‍ය නීතිඥ තලතා අතුකෝරල මහත්මියට ලැබුණ තොරතුරක් මත, විමර්ශන අංශයට නියෝග කොට ඇත්තේ එම ස්ථානය වහාම පරීක්ෂා කරන ලෙසයි. ඒ අනුව කාර්යාංශයේ නීති අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කීර්ති මුතුකුමාරණ මහතා සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රදීප් ජයවර්ධන යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි, පොලිස් පරීක්ෂක පී.බී විජේසිරි, උප පොලිස් පරීක්ෂක රාජිත වර්ණප්‍රිය අතුළු නිළධාරීන් වැටලීමට එක් වූහ.

සැකකරු දෙවන දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට මාලිගාකන්ද මහේස්ත්‍රාත් තීරණය කොට තිබේ.